කඩුවෙල මහා නගර සභාව - 2022
-----------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කඩුවෙල මහා නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කඩුවෙල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5** වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහානගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය - 2017 අනුව මූල්‍ය ප්‍රකාශනවල පහත සඳහන් කරුණු හෙළිදරව් කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| යොමුගත වගන්තියට අනුව රු.මිලියන 515ක් වටිනා මාස 12ට අඩු ස්ථාවර තැන්පතු ජංගම වත්කම් ලෙස හඳුනාගෙන නොතිබුණි | පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පුහුණු සැසියේදී ලබාදුන් ආකෘතිය හා උපදෙස් අනුව ස්ථාවර තැන්පතු වටිනාකම ගිණුම්ගත කර තිබූ අතර විගණන විමසුමේ දක්වා ඇති කරුණු සලකා වත්කම් වර්ගීකරණයන් යටතේ ඉදිරිපත් කිරීමට ඉදිරි මූල්‍ය වර්ෂයේදී කටයුතු කරන බව. | වත්කම් වර්ගීකරණ ප්‍රමිතයට අනුව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කඩුවෙල දිස්ත්‍රික් කාර්යාලයේ අලුත්වැඩියා හා කාර්යාල උපකරණ සඳහා වෙන් කරන ලද රු.6,000,000 ක ඇස්තමේන්තු වටිනාකම අලුත්වැඩියා හා නඩත්තු වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණි. | ණයහිමි ප්‍රතිපාදන මඟින් දැරූ වියදමේ ස්වාභාවය සොයාබලා ජ'නල් මඟින් නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරන බව. | වත්කම් නිවරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ පාරවල් ,බෝක්කු ,මංමාවත් ක්ෂය රු.20,243,202 ක් වුවද මූල්‍ය ප්‍රකාශන වල රු.28,449,065ක් ලෙස දැක්වීම හේතුවෙන් වාර්ෂික ක්ෂය රු.8,205,863ක් වැඩියෙන් ගිණුම් ගත කර තිබුණි. | අදාල දෝෂ ජ'නල් අංක 2 මඟින් නිවැරදි කිරීමට කටයුතු කළ බව. | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මිලදී ගන්නා ලද බෝට්ටු 10ක් වෙනුවෙන් 2021 වර්ෂයේ රු.6,112,871 ක් මෝටර් බෝට්ටු ගිණුම හර කර ණය හිමි ලෙස සටහන් කර තිබුණද 2022 වර්ෂයේදි ඒ සඳහා ගෙවූ මුදල රු.4,737,939ක් විය.ඒ අනුව මෝටර් බෝට්ටු ගිණුම රු.1,374,932 ක් වැඩියෙන් ගිණුම් ගත කර තිබුණි .එසේම 2021 වර්ෂයේ මිලදී ගැනීම් සේ සලකා 2022 වර්ෂයේ ක්ෂය වීම් ලෙස රු.80,349 කපා හැරීම හේතුවෙන් අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් ගිණුම්ගතවි තිබුණි. | අදාල ගිණුම්කරන දෝෂ ජ'නල් අංක 2.2, 2.3 යටතේ නිවැරදි කිරීමට කටයුතු කළ බව. | -එම- |

## 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

**නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) මු.රෙ 395(ඇ ) | ඊලග මාසයේ 15 දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියල කළ යුතු වුවද සභාව ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නියමිත දිනට බැංකු සැසඳුම් පිළියෙල කිරීමට කටයුතු කරන බව. | මු.රෙ. ප්‍රකාරව නියමිත දිනට පෙර බැංකු සැසඳුම් පිළියෙල කළ යුතුය. |
| (ii) මු.රෙ 396(ඇ) | 2022 දෙසැම්බර් 31 දිනට බැංකු ගිණුම් දෙකකට අදාළ නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ මාස 06 ක කාලය ඉක්මවන ලද රු.1,779,646 ක වටිනාකමැති චෙක්පත් 10 ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසිය පරිදි කටයුතු කර නොතිබුණි. | චෙක්පත් සඳහා අදාළ ආයතන දැනුවත් කිරිමේ ලිපි යවා ඇති අතර අංක. 465209, 465348 හා 464636 දරන චෙක්පත් සඳහා හිලව් චෙක්පත් නිකුත් කර ඇති බව. | මු.රෙ. ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

**ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ ආදායම රු.243,511,413ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.622,069,391ක් විය.**

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය බැංකුවක ජංගම ගිණුම වර්ෂ 05ට වැඩි කාලයක සිට අක්‍රීය තත්වයේ පවතින අතර 2022 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.600,353ක් විය. | 2006 අගෝස්තු මාසයේදී බැංකුවේ පරිගණක ක්‍රමය වෙනස් කිරීමේදී ජුලි 30ට ශේෂය සහ 2006 අගෝස්තු 01 දිනට ජංගම ගිණුමේ ශේෂය අතර හදුනානොගත් රු. 14,250ක ගෙවීමක් මේ දක්වා නිරවුල් කර ගැනීම සඳහා පවතින බැවින් එය නිරවුල් කරන තුරු ගිණුම වසා දැමීමට නොහැකි බව. | ශේෂ නිරවුල් කිරීම සම්බන්ධව අදාල ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

නගරාධිපති විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | 2022<br>බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර්3 1 දිනට මුළු හිඟය | ඇස්තමේ න්තුගත ආදායම | බිල් කළ ආදායම | 2021<br>රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 232,845 | 240,489 | 230,022 | 10,467 | 204,861 | 262,138 | 243,579 | 18,559 |
| (ii) | කුලී | 26,714 | 20,355 | 20,611 | (255) | 24,325 | 14,515 | 16,118 | (1,603) |
| (iii) | බලපත්‍ර ගාස්තු | 16,653 | 19,991 | 20,170 | (179) | 7,110 | 24,594 | 13,930 | 10,663 |
| (iv) | වෙනත් ආදායම් | 992.930 | 1,084,801 | 1,084,801 | - | 292,241 | 1,076,142 | 1,076,142 | - |
| | | 1,269,142 | 1,365,636 | 1,355,604 | 10,033 | 528,537 | 1,377,389 | 1,349,769 | 27,619 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂ කීපයක සිට පැවත එන අය විය යුතු රු.71,095,083 ක් විය. | 2022.12.31 දිනට වරිපනම් හිඟ ශේෂය රු. 87,698,635 න් තවදුරටත් ලැබිය යුතු මුදල රු.71,095,083 ක් බව. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභා බල ප්‍රදේශයට අයත් සිනමාහල් දෙකකින් වර්ෂ කීපයක සිට පැවත එන ලැබියයුතු විනෝද බදු ආදායම රු.5,318,936 ක් විය. | මෙම හිඟ මුදල් සඳහා කඩුවෙල දිසා අධිකරණයේ නඩු විභාග වෙමින් පවතින බව. | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසන් දිනට හිඟ කුලී ආදායම රු.5,725,434 ක් අයකර ගැනීමට සභාව ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2022.12.31 දිනට අය විය යුතු හිඟ මාසික කුලී මුදල -රු.5,725,434කි. හිඟ මුදල මාස 03 ඉක්මවා ඇති මාසික කඩ කුලී පවතින කඩ කාමර මුද්‍රා තබා නීතිමය පියවර ගැනීමට කටයුතු සිදු කරන බව. | -එම- |
| (ඈ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.28,719,924 ක් හා මුද්දර ගාස්තු රු.1,057,844,911 ක් විය . | ලැබිය යුතු මුදල සම්බන්ධයෙන් උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු පිටපත් කර ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති බව. | උසාවි දඩ හා මුද්දර ගාස්තු ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2022 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා සැලසුම් කමිටුවට ඉදිරිපත් කළ අයදුම් පත්‍ර අතරින් කඩුවෙල, බත්තරමුල්ල සහ අතුරුගිරිය කාර්යාල වලට 2020 දෙසැම්බර් 31 දිනට පෙර ඉදිරිපත් කල අයදුම් පත්‍ර 355 ක් තිබුණි. | සැලසුම් කමිටුව වෙත ඉදිරිපත් කරන අයදුම්පත් සඳහා කමිටුවෙන් ලබා දෙන අඩුපාඩු අයදුම්කරුවන් වෙත දන්වා ඇතත් අයදුම්කරුවන් විසින් අදාළ අඩුපාඩු සකස් කර ඉදිරිපත් නොකිරීම හේතුවෙන් මෙම ප්‍රමාදයන් සිදුවූ බව. | පසුවිපරම් කර පැමිණිලි නිරවුල් කිරීම කඩිනම් කළ යුතුය. |
| (ආ)2020 වර්ෂයට පෙර සභාව සතුව පැවති පාරවල්, බෝක්කු, මංමාවත් හඳුනා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි . | 2020 වර්ෂයට පෙර සභාව සතුව පැවති පාරවල්,බෝක්කු,මංමාවත් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණද, GIS මෘදුකාංගය හරහා යාවත්කාලීන කරමින් පවතින බව. | එම වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කිරීම කඩිනම් කළ යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 05 දින ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව විධිමත් ගිවිසුමක් හෝ මාසික කුලී අයකිරීමකින් තොරව සභා පරිශ්‍රයේ ඉදි කර ඇති අපනශාලාව අපනශාලා හිමියකු හට පවත්වාගෙන යාමට අවසර ලබා දී තිබුණි .එසේම එම පරිශ්‍රයේ ජල හා විදුලි බිල්පතද සභාව විසින් ගෙවා තිබුණි .මේ අනුව මාස 08ක කාලයක් තුල සභාවට ලැබිය යුතු ආදායමක් අහිමි වි තිබු අතර එම පරිශ්‍රය නඩත්තු කිරීම සඳහා වැය බරක් දැරීමට සභාවට සිදු වි තිබුණි. | මහා නගර සභා පරිශ්‍රයේ ආපන ශාලාව සඳහා එය පවත්වාගෙන යනු ලබන පාර්ශවය විසින් ජල විදුලි බිල්පත් ගෙවිය යුතු බවටත්, මාසික කුලී මුදල වශයෙන් රු 15,000ක මුදලක් අය කිරීමටත්, මෙම අයකිරීම් 2023 මැයි මස සිට ක්‍රියාත්මක වන පරිදි ලබා ගැනීමටත්, ඒ අනුව මාස තුනක කාලසීමාවක් සඳහා මෙම ආපන ශාලාව පවත්වාගෙන යාමේ අවස්ථාව මෙම පාර්ශවකරු වෙත ලබාදීමටත් 2023/01/ප/තීරණ අංක 178 හා 2023 මැයි මස 12 දිනැති පරිපාලන කමිටුව තීරණය කරන ලද බව. | සභාවට අහිමි වූ ආදායම අයකර ගැනීමට පියවර ගත යුතුය. කමිටුව තීරණය කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය. |

### 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් 2022 වර්ෂයේ ජනවාරි සිට ජූලි මාසය දක්වා රත් පැලැස්ස කසල අංගනයේ කසල ප්‍රවාහනය වෙනුවෙන් රු.25,316,868 ක පිරිවැයක් දරා තිබුණ අතර ඒ සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 ඡේදය ප්‍රකාරව මිල ගණන් කැඳවීමකින් තොරව පෙර වර්ෂයේ කසල ප්‍රවාහනය කල ආයතනය මඟින්ම මෙම සේවාව | රටේ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් කසල කළමනාකරණ කටයුතු සඳහා වාහන යොදා ගැනීම මහත් අසීරු වීමත්. දෛනිකව කසල බැහැර කිරීමේ කටයුතු අතපසු වුවහොත් මහත් ගැටළු සහගත තත්ත්වයකට පත් වන බැවින් ද ප්‍රසම්පාදන කටයුතු සිදු නොකර 2021 වර්ෂයේ ගිවිසුම් වලින්ම අදාළ සේවාව සිදු කර ගන්නා ලදී. මේ වන විට ප්‍රසම්පාදන කටයුතු සිදු කර ගන්නා ලද | ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර ගිවිසුම්ගත වීම කඩිනමින් කළ යුතුය. |

| | | |
|---|---|---|
| ලබා ගෙන තිබුණි. මේ සඳහා 2022 වර්ෂයේ ගිවිසුමක් නොතිබූ අතර 2021 වර්ෂයේ ගිවිසුමට අනුව ප්‍රවාහන පහසුකම් ලබාගෙන තිබුණි. | බව සහ ඉන්ධන මිල ගණන් හා අනෙකුත් භාණ්ඩ මිල වැඩිවීම හේතුවෙන් කසල බැහැර කරනු ලබන පාර්ශවයන්ට සේවය ලබාදීම අපහසු බැවින් එම පාර්ශ්වයේ ඉල්ලීම් මත මිල සූත්‍රය අනුව ගෙවීම් සිදු කළ බව. | |

**3.4** මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාණ්ඩලික ශ්‍රේණියේ අනුමත තනතුරු වලින් සියයට 36 ක් එනම් අනුමත තනතුරු 14න් 5ක්ම වර්ෂ තුනකට වැඩි කාලයක සිට පුරප්පාඩුව පැවතුණි. | මාණ්ඩලික නිලධාරී තනතුරු පුරප්පාඩු පිළිබඳව මාසිකව හා ත්‍රෛමාසික වාර්තා මඟින් ප්‍රධාන ලේකම් දැනුවත් කරනු ලබන නමුත් මේ වන තෙක් එම පුරප්පාඩු පුරවා නොමැති බව. | පුරප්පාඩු පිරවීම කඩිනමින් කළ යුතුය. |

**4.** ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පොදු උපයෝගී සේවා සහ සුබසාධක සේවා යටතේ වූ ක්‍රීඩා හා සමාජ සුභසාධන කටයුතු වල “ක්‍රිඩාව තුළින් සෞඛ්‍ය සම්පන්න ජනතාවක් බිහි කිරීම” හා “ක්‍රිඩා ප්‍රවර්ධන වැඩසටහන්” ක්‍රියාත්මක කිරීම සියයට 5 ක් තරම් අවම මූල්‍ය ප්‍රගතියක් අත්පත් කර ගෙන තිබුණි | මහා නගර සභාවේ ක්‍රීඩා සමාජයක් පිහිටුවා ඇතත්, කොරෝනා වසංගතයට අදාලව නිකුත්කල චක්‍රලේඛයන්ට අනුව ක්‍රීඩා කිරීම හා එක් රැස්වීම තහනම් කිරීම නිසා ක්‍රීඩා සමිතිය ඉදිරියට පවත්වාගෙන යාමට නොහැකි වූ බව. | ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. |